**බෙන්තොට ප්‍රාදේශීය සභාව**
**ගාල්ල දිස්ත්‍රික්කය.**
**------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 30 දින ද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 30 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, 2016 වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 සැප්තැම්බර් 04 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට බෙන්තොට ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු රු.4,537,005 ක දායක මුදල ණයහිමියන් යටතේ ගිණුම් ගතකර නොතිබීමෙන් වර්ෂයේ වියදම් හා ජංගම බැරකම් ඉහත වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ පුස්තකාල පොත් මිලට ගැනීමේ දී ලැබී තිබුණු රු.155,644 ක වට්ටම ගිණුම්ගත කර නොතිබීම නිසා වර්ෂයේ ආදායම් හා වත්කම් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) 2015 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව භෞතිකව පවතින බව තහවුරු වූ තොග ඒකක 55 ක වටිනාකම තක්සේරු කර ගිණුම් ගතකර නොතිබුණෙන් ජංගම වත්කම් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) ගබඩාව තුළ පවතින බව හා ලේඛනවල පවතින බව තහවුරු නොවූ රු.68,304 ක් වූ කර්මාන්ත තොග අයිතම 04 ක් සම්බන්ධයෙන් අදාළ ගැලපීම් කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ රු.92,337 ක ඉදිරි ගෙවීම් දක්වා නොතිබුණි.

(ඊ) අමයන්ගොඩ ඕවිට නැමැති ඉඩම වෙන්දේසි කිරීමේදී පොදු පහසුකම් සඳහා සභාවට ලබාදුන් පර්චස් 40.75 ඉඩම් කොටසේ වටිනාකම ගිණුම්ගත කර නොතිබීමෙන් ස්ථාවර වත්කම් හා ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායක වීමේ ගිණුම අඩුවෙන් දක්වා තිබුණි.

**1.3.2 නොසැසඳූ පාලන ගිණුම්**

-------------------------

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.12,150,417 ක් වූ ගිණුම් විෂයයන් 05 ක ශේෂ සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන හා වාර්තාවල දැක්වෙන ශේෂ අතර එකතුව රු.846,517 ක් වූ අසමානතා නිරීක්ෂණය විය.

**1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

---------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) 2011 වර්ෂයේ සිට පැවත එන රු.11,559,208 ක් වූ කර්මාන්ත ණයගැති ශේෂ 33 ක් සමාලෝචිත වර්ෂයේදීත් නිරවුල් කර නොතිබුණි.

(ආ) 2001 වර්ෂයේ සිට 2013 වසර දක්වා කාලයට අදාළව සභාවට අයවිය යුතු එකතුව රු.1,788,951 ක් වූ මුද්දර ගාස්තු අයකර ගෙන නොතිබුණි.

(ඇ) 2009 වර්ෂයට අදාළ රු.104,000 ක් වූ වැටුප් ප්‍රතිපූර්ණ හා 2012 වර්ෂයට අදාළ උසාවි දඩ රු.53,833 ක් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදීත් පියවර ගෙන නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ අවසානයට එකතුව රු.3,192,252 ක් වූ ලැබිය යුතු ගිණුම් ශේෂ 06 ක වටිනාකම නිරවුල් කර ගෙන නොතිබුණි.

(ඉ) එකතුව රු.13,432,508 ක් වූ ණයහිමි ශේෂ නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදීත් පියවර ගෙන නොතිබුණි.

**1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම**

-----------------------------------

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.118,153,755 ක් වූ ස්ථාවර වත්කම් අයිතම 05 ක් සම්බන්ධයෙන් විධිමත්ව හා යාවත්කාලීනව සකස් කළ ඉඩම් හා ගොඩනැගිලි ලේඛනය, යාවත්කාලීන කරන ලද වත්කම් පන්ති අනුව පිළියෙල කරන ලද ස්ථාවර වත්කම් ලේඛනය හා රු.1,447,524 ක් වූ අතැති තොග සම්බන්ධ යාවත්කාලීන කරන ලද තොග ලේඛන ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේ දී ඒවා සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

**1.3.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත දැක්වෙන නීති, රීති සහ රෙගුලාසි විධිවිධානවලට අනුකූල නොවීමේ අවස්ථා විගණනයේ දී නිරීක්ෂණය විය.

| නීති, රීති රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 371(2)(ආ) | 1993 වර්ෂයේ සිට ඉදිරියට ගෙනෙමින් පවතින රු.159,278 ක් වූ සාමාන්‍ය අත්තිකාරම් ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.29,686,524 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.12,950,973 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේ දී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.16,735,551 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

### 2.2 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

ඉකුත් වර්ෂ සමඟ සමාලෝචිත වර්ෂයේ තත්ත්වය සැසඳීමේ දී ජංගම සහ ක්ෂණික අනුපාතවල සතුටුදායක තත්ත්වයක් පෙන්නුම් කෙරෙන නමුත්, වර්ෂ 03 ත් වර්ෂ 05 ත් අතර කල් ඉකුත් වූ රු.15,848,159 ක ණයගැති ශේෂ පවතින බැවින්, එම අනුපාත ප්‍රකාර ද්‍රවශීලතා තත්ත්වයක් නොපවතින බව නිරීක්ෂණය විය.

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 වරිපනම් හා බදු

සමාලෝචිත වර්ෂයේ දී අයකර ගත යුතුව තිබුණු රු.11,747,533 ක් වූ වරිපනම් බදු මුදලින් වර්ෂය තුළ සියයට 68 ක් පමණක් අයකර ගැනීම නිසා වර්ෂය අවසානයට හිඟ මුදල රු.3,776,359 ක් දක්වා ඉහළ අගයක් ගෙන තිබුණි.

**2.3.2 අක්කර බදු**

**------------**

සමාලෝචිත වර්ෂයේ දී රු.155,503 ක් අය කරගත යුතුව තිබුණ ද, වර්ෂයේ අය කිරීම් රු.3,518 ක් හෙවත් සියයට 02 ක් තරම් අවම අගයක් විය. මේ හේතුව නිසා වර්ෂය අවසානයට හිඟ මුදල රු.151,985 ක් වී තිබුණි.

**2.3.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

-----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2016 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු.1,116,180 ක් හා මුද්දර ගාස්තු වෙනුවෙන් රු.38,664,949 ක් ලැබිය යුතුව තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**--------------------------**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

**---------------------------------**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සේවක සංඛ්‍යා සැලැස්ම අනුව18 ක් වූ අතිරික්ත කාර්ය මණ්ඩලය විධිමත් කර ගැනීමටත්, 07 ක් වූ පුරප්පාඩු තනතුරු පුරවා ගැනීමට පියවර ගෙන නොතිබුණි.

(ආ) විශ්‍රාම ගිය, සේවය හැර ගිය හා මිය ගිය නිලධාරීන් 27 දෙනෙකුගෙන් දීර්ඝ කාලයක් තිස්සේ අය නොවී පවතින එකතුව රු.96,375 ක් වූ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) පළාත් පාලන කොමසාරිස් වෙතින් අයවිය යුතු දේපළ ණය ප්‍රතිපූර්ණය රු.164,500 ක මුදලක් 2007 වර්ෂයේ සිටම අය වී නොතිබුණි.

(ඈ) සභා බලප්‍රදේශයේ සංවර්ධන ව්‍යාපෘති 07 ක් සඳහා 1987 සිට 1991 දක්වා කාලයේ දී ලැබී තිබූ රු.285,712 ක මුදලක් අදාළ ව්‍යාපෘති සඳහා යොදවා නොගෙන 2016 වර්ෂයේ දී ආදායමට ගෙන තිබුණි.

(ඉ) 2014 වර්ෂය සඳහා සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට යැවිය යුතු රු.14,871 ක දායක මුදල් සහ සේවක අර්ථසාධක අරමුදලට යැවිය යුතු රු.15,527 ක දායක මුදල් එම අරමුදල් වලට නොයවා පොදු තැන්පත් ගිණුමේ රඳවා තිබුණි.

(ඊ) 2016 වර්ෂයේ සෑම මාසයකම ලංකා බැංකු ජංගම ගිණුමේ සාමාන්‍ය මාසික ශේෂය රුපියල් මිලියන 03 ක් ඉක්මවා පැවති නමුත්, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 171 හා 184 වගන්ති ප්‍රකාරව එම මුදල් ආයෝජනය කිරීම කෙරෙහි සලකා බලා නොතිබුණි.

(උ) (i) සමාලෝචිත වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ කටයුතු 2017 මැයි 31 දින වන විටත් අවසන් කර නොතිබුණි.

(ii) 2015 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය විසින් හඳුනාගත් සමීක්ෂණයට භාජනය නොවූ භාණ්ඩ 984 ක්, ඌණතාවයන් හා අතිරික්තයන් ලෙස හඳුනාගත් භාණ්ඩ 145 ක් සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඌ) (i) පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ලබා දී තිබුණු ලීටර් 20 ක ධාරිතාවයෙන් යුතු කසල බඳුන් 16 ක් සහ ලීටර් 60 ධාරිතාවයෙන් යුතු කසල බඳුන් 10 ක් කිසිදු ප්‍රයෝජනවත් කාර්යයකට යොදවාගෙන නොතිබුණි.

(ii) පෞද්ගලික ආයතනයක් විසින් කොම්පෝස්ට් නිෂ්පාදනය සඳහා 2007 වර්ෂයේ ප්‍රදානය කර තිබුණු පිරිවැය රු.91,000 ක් වූ යන්ත්‍ර දෙකක් සහ පිරිවැය රු.108,000 ක් වූ අත් ට්‍රැක්ටරයක් කිසිදු ප්‍රයෝජනවත් කාර්යයකට යොදවා නොගෙන වසර 10 කටත් අධික කාලයක් තිස්සේ නිෂ්කාර්යව තිබුණි.

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

-----------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

**(අ) වීථි පහන් නඩත්තුව**

----------------------

විදුලිබල මණ්ඩලය සමඟ ප්‍රාදේශීය සභාව ඇතිකර ගෙන තිබුණු ගිවිසුම 2015 වර්ෂයේ කල් ඉකුත් වී තිබුණු අතර, විදුලිබල මණ්ඩලයේ ප්‍රාදේශීය ඉංජිනේරුවරයාගේ අංක ලි/10/වීථිපහන් දරන 2016 ජූනි 07 දිනැති ලිපිය ප්‍රකාරව ගිවිසුම්ගත නොවීම නිසා 2014 වර්ෂයෙන් පසුව වීථි පහන් සඳහා ප්‍රතිපූර්ණයන් ලැබී නොතිබුණි.

**(ආ) වෙන්දේසි ඉඩම් වලින් පොදු පහසුකම් සැපයීම සඳහා ඉඩම් ලබා ගැනීම**

---------------------------------------------------------------------------

2016 වර්ෂයේ පුද්ගලික ආයතනයක් විසින් අක්කර 05 රූඩ් 02 පර්චර්ස් 31 ක් විශාල ඉඩමක් කැබැලි කර වෙන්දේසියේ දී පොදු පහසුකම් සැපයීම සඳහා සභාවට වෙන් කළ ඉඩම් ප්‍රමාණය ලබා ගැනීමට පෙර නාගරික සංවර්ධන අධිකාරිය විසින් අනුකූලතා සහතිකය නිකුත් කිරීම නිසා සභාවට ලැබිය යුතු ඉඩම් ප්‍රමාණය ලැබී නොතිබුණි.

(ඇ) **සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි හෝටල් වල ආදායමින් 1% ක බදු අයකර ගැනීම**

-----------------------------------------------------------------------------------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය ප්‍රකාරව සංචාරක සංවර්ධන පනත යටතේ ලියාපදිංචි කරනු ලැබූ හෝටල්, ආපන ශාලා හා ලැගුම් හල් වල ආදායම් මත අය කරනු ලබන සියයට 1 ක බදු අය කිරීමේ දී හෝටල් 18 ක් සඳහා විගණනය කළ ගිණුම් ඉදිරිපත් කර නොතිබුණු අතර, හෝටල් විසින් ලබාදුන් ආදායම මත අදාළ ගාස්තු අයකර තිබුණි.

**3.3 ව්‍යාපෘති ප්‍රමාද කිරීම**

-----------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ 2016 වර්ෂය සඳහා අනුමත ව්‍යාපෘති 08 න් ව්‍යාපෘති 05 ක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) මහාමාර්ග හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය විසින් අතුරුවැල්ල ඉඹුල්ගහවත්ත මාර්ගයේ කොටසක් පළල මීටර් 03 ක් වන පරිදි දිග මීටර් 156 ක කොටස සඳහා පෙරසැරි ගල් යෙදීමට 2014 වර්ෂයේ අනුමත වී තිබූ රු.1,000,000 ක මුදලක් 2014 දෙසැම්බර් 31 දිනට පෙර ව්‍යාපෘතිය ආරම්භ නොකිරීම නිසා අවලංගු කරන ලද බව අදාළ අමාත්‍යාංශය විසින් 2015 ජනවාරි 20 දින දැනුම් දී තිබුණි.

**3.4 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

----------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) කසල බැහැර කිරීම සඳහා නිසි ක්‍රමවේදයක් නොතිබූ අතර, දෛනිකව එකතු කරන කසළ ජම්බුගහපිටිය වත්ත නැමැති ඉඩමකට බැහැර කර, පස් යොදා වැසීම සිදු කළද, නිසි ලෙස පස් නොයෙදීමත්, ඉඩම තුළ කසළ ගොඩ ගැසීමත් නිසා මදුරුවන් සහ මැස්සන් ගහනය වැඩිවීමෙන් බලප්‍රදේශයේ ජනතාවගේ සෞඛ්‍ය පිළිබඳ අවදානමක් පැවැතුණි.

(ආ) ප්‍රාදේශීය සභා පනතේ 93, 94 සහ 95 යන වගන්ති ප්‍රකාරව සභා බලප්‍රදේශයේ කසළ සම්බන්ධයෙන් පූර්වාරක්ෂක විධිවිධාන යෙදීම පිළිබඳ කිසිදු වැඩ පිළිවෙලක් සභාව සතුව නොතිබුණි.

(ඇ) කසල බැහැර කරන භූමිය සඳහා පරිසර බලපත්‍රයක් නොතිබුණි.

## 4. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### 4.1 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛනයේ ඇතුළත් වියදම් විෂයයන් 06 ක එකතුව රු.30,537,603 ක් වූ ඉතිරිවීම් ද, තවත් විෂයයන් 02 ක රු.162,363 ක් වූ අහිතකර විචලනයන් ද, ආදායම් විෂයයන් 02 ක එකතුව රු.2,785,995 ක් වූ ළඟාකර නොගත් ඉලක්කගත ආදායම් ද පැවැතීම නිසා අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

### 4.2 අභ්‍යන්තර විගණනය

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 133 හා 134 හි විධිවිධාන හා පළාත් පාලන කොමසාරිස්ගේ (දකුණු පළාත) 2014 පෙබරවාරි 24 දිනැති අංක : දපපා/යහ/01/නා.ව.ලේ දරන චක්‍රලේඛය ප්‍රකාර ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර, එම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

### 4.3 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම

2009 ජුනි 09 දිනැති අංක DMA/2009(i) දරන කලමනාකරණ විගණන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

### 4.4 නොවිසඳී ඇති විගණන විමසුම්

ඉකුත් වර්ෂය සඳහා වූ විගණකාධිපති වාර්තාවේ අංක 2.2.2 ඡේදයේ (ආ), (ඇ), (ඊ), සහ (ඒ) යන ඡේද වලින් පෙන්වා දෙන ලද අඩුපාඩු නිවැරදි කිරීමට එකඟ වී තිබුණු නමුත්, සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් එකඟ වූ පරිදි කටයුතු කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලන

විගණනයේ දී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින් වර විගණන විමසුම් මඟින් සභාවේ අවධානයට යොමු කරන ලදී. පහත විස්තර දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

| | පද්ධතිය | | පද්ධතියේ ප්‍රධාන අඩුපාඩු |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් | (i) | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ, ලී බඩු හා සවිකිරීම් සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛන යාවත්කාලීන කර නොතිබුණි. |
| | | (ii) | කොම්පෝස්ට් නිෂ්පාදන යන්ත්‍ර භාවිතා කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) | ආදායම් රැස්කිරීම | (i) | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු නොකිරීම නිසා හිඟ ශේෂ ඉහළ අගයන් ගෙන තිබුණි. |
| | | (ii) | උසාවි දඩ මුදල් හා මුද්දර ගාස්තු ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| | | (iii) | හිඟ ආදායම් පිළිබඳ කාල විශ්ලේෂණ පිළියෙල නොකිරීම නිසා සභාවට ලැබිය යුතු ආදායම්වල හිඟ කාලය හඳුනා ගැනීමට නොහැකි විය. |
| (ඇ) | ගිණුම්කරණය | (i) | මූල්‍ය ප්‍රකාශන වල සහ ඊට අදාළ උපලේඛනවල දැක්වෙන අගයන් අතර වෙනස්කම් පැවැතුණි. |
| | | (ii) | මූල්‍ය ප්‍රකාශනවල නොවෙනස්ව ඉදිරියට එන ශේෂ පිළිබඳව සොයා බලා ඒවා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| | | (iii) | ඇතැම් වාහන හා උපකරණවල වටිනාකම තක්සේරු කර ගිණුම් ගතකර නොතිබුණි. |
| (ඈ) | සේවක මණ්ඩල කළමනාකරණය | | අතිරික්ත තනතුරු විධිමත් කර ගැනීමටත්, පුරප්පාඩු පුරවා ගැනීමටත් කටයුතු කර නොතිබුණි. |
| (ඉ) | කොන්ත්‍රාත් පරිපාලනය හා ව්‍යාපෘති ප්‍රමාද කිරීම් | (i) | ගිවිසුම්ගත පරිදි කොන්ත්‍රාත් නිමකර නොතිබුණි. |
| | | (ii) | සභාවට ලද ව්‍යාපෘති නිසි කාල වකවානු තුළදී ඉටු කර නොතිබුණි. |
| (ඊ) | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය | (i) | වර්ගීකරණය කර කසල එකතු කර නොතිබුණි. |

(ii) ප්‍රදේශයේ ජනතාවගේ සෞඛ්‍යයට බාධා ඇති නොවන පරිදි කසල බැහැර කර නොතිබුණි.

(iii) කසල ප්‍රමාණය අවම කිරීම සඳහා සුදුසු වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(iv) කසල බැහැර කරන ඉඩමට පරිසර බලපත්‍රයක් ලබාගෙන නොතිබුණි.